

# පින් රුකෙක මහිම

Chandananda

# පින් රුකෙක මහිම

## ඇමෙරිකන් කෝවිද හිමි චරිතය

# මීතිරිගල නිස්සරණ වනය

ධර්ම දානය පිණිසයි

ප්‍රකාශක

රංජිත් පෙරේරා

207/6 ඒ ධර්මපාල මාවත, කොළඹ 07

අන්තර්ජාලයට එක් කිරීම සඳහා pdf ගොනුවක් ලෙස සකස් කරන ලද්දේ -

ශ්‍රී සුමන යෝගාශ්‍රමය
ලෙව්කේ-ගල්අතර-මාවනැල්ල
ශ්‍රී ලංකා

| | |
|---|---|
| පළමුවන මුද්‍රණය | 1988 ජනවාරි |
| දෙවන මුද්‍රණය | 1988 මාර්තු |
| තෙවන මුද්‍රණය | 2001 ජූනි |

මුද්‍රණය
කොලිටි ප්‍රින්ටර්ස්
පැහිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.
දුරකතනය: 074-302312

# පටුන

පිටු

හැඳින්වීම v

ආදර්ශ සම්පන්න යෝගාවචර ජීවිතයක අවසානය viii

ආද්ධ්‍යාත්ම සෘද්ධිය ix

පින් පැලය 1

"හැදෙන - ගස" 2

ලක් - පොළොවට 3

පැවිදි පිදීම 3

සිල් - මල් 4

නැණ - පල 6

මෝරන - හරය 7

ගුණ - සුවඳ 8

කදෙක ති-ලකුණු 10

සිහිවටන 12

"ගුරු-බැති-පුද" 14

# ආශ්‍රිත ග්‍රන්ථ

1 ම.නි. - මජ්ඣිම නිකාය
2. ධ.ප. - ධම්මපද
3. සු.නි. - සුත්ත නිපාත
4. බු.ජ. - බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා

## (පළමුවන මුද්‍රණය)

මහ වනයක, මරු කතරක, අතරමං වූවකුහට පෙත්-මහක්, මිනිස් පිය සටහනක් යම්බඳු ධෛර්‍යයක් වේද, මෝහයෙන් මුළා වූ ලෝකයකට සාධු චරිතාපදානයත් එසේමය. මෙයට දෙ මසකට පෙර අපවත්වී වදාළ ගරු ඇමෙරිකන් කෝවිද ස්වාමීන් වහන්සේ සසුන් පිළිවෙත් මඟෙහි තැබූ පිය සටහන් පෙළ ඇසුරින් සකස් වූ "පින් රුකෙක මහිම" නන් අයුරින් සැනසුම සොයමින් නිසි-අනිසි මං නොදැන වෙහෙසෙන ලෝකයාහට ද එවැනිම දිරියක් ගෙන දෙනු ඇතැයි හඟිමු.

ප්‍රබන්ධ කථාවක් මෙන් නොව චරිත කථාවක් සපුරා බිහිවන විට එහි "නියම කතුවරයා" ජීවතුන් අතර නැත. තම චරිත කථාවෙහි ආදර්ශවත් බව, විසිතුරු බව හා සිද්ධි සංඝටනාව වෙනුවෙන් "කතුවරයා" සිය ජීවිතය පවා පරිත්‍යාග කරයි. ගරු කෝවිද හිමියෝද. ආත්ම පරිත්‍යාගයකින් යුතුව අපූර්ව "සාරාංශ" ශෛලියකින් ස්වකීය ආදර්ශවත් චරිත කථාව නිම කළහ. ධර්ම කාමී අනාගත පරපුර උදෙසා එම කෙටි චරිතාපදානය සටහන් කර තැබීමට යෝගාවචර පැන් තුඩක් දරූ තැතක් පමණි මේ.

මීතිරිගල නිස්සරණ වනයේ පරමාදර්ශය වන නිශ්ශරණාධ්‍යාශය මැනවින් පිළිබිඹු කරන මෙම චරිත කථාව අවශ්‍යයෙන්ම පාඨක ලෝකයා වෙත ඉදිරිපත් කළයුත්තකැයි පිළිගත් නිස්සරණ වනයේ ප්‍රධාන කර්මස්ථානාචාර්‍ය අති පූජ්‍ය ගෞරවණීය මාතර ශ්‍රී ඥානාරාම මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේත්, ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සමුත්පාදක අතිපූජ්‍ය රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශ මාහිමිපාණන් වහන්සේත් ග්‍රන්ථ ගෞරවයට හේතුවන ප්‍රස්තාවනා දෙකකින් එය අනුමත කොට වදාළහ. ඒ සංඝපිතෘන් වහන්සේලා හට කෘතඥතා පූර්වක භක්ති ප්‍රණාමයෙන් දීර්ඝායුඃ ශ්‍රී ප්‍රාර්ථනා කරමු.

භාරදූර වැඩකටයුතු රාශියක් මධ්‍යයේ මෙම පොත මුද්‍රණද්වාරයෙන් එළිදැක්වීමට නිසි සංවිධානය යෙදීමෙන් ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සඞ්ඝාලේඛකාධිකාරී ගෞරවණීය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේ අපහට දැක්වූ අනුග්‍රහය විශේෂයෙන් සිහිපත් කරන අතර මේ ශාසන මෙහෙයත් උන්වහන්සේගේ දිනෙන් දින වැඩෙන උදාර පාරමී ශක්තියට එකතු වේවායි පතමු. එසේම, පොතෙහි පළමු පිටපත කියවා බලා ගුණ දොස් දක්වමින් එය සංශෝධනය කිරීමෙන්ද, කෝවිද චරිතයෙහි වැදගත් අංශ කෙරෙහි අප අවධානය යොමු කැරැවීමෙන්ද, පොත මුද්‍රණයට

යැවීම සඳහා යතුරු ලියනයෙන් ශෝභන පිටපතක් සකස්කර දීමෙන්ද, සහාය වූ ගරු සබ්‍රහ්මචාරීන් වහන්සේලා හට අපගේ කෘතඥතාව හිමිවේ. පොදු ශාසනික කටයුත්තක් සේ සළකා මේ සත් කෘත්‍යයට අත-හිත දුන් පිනිත් ඒ හැමදෙනා වහන්සේලාගේම සියලු ධර්ම ප්‍රාර්ථනා සමෘද්ධිමත් වේවා!

ධර්මදානයක් වශයෙන් පොත මුද්‍රණය කරවා ප්‍රකාශ කිරීමට උනන්දුවෙන් ඉදිරිපත්වූ නිස්සරණ වන සංරක්ෂණ මණ්ඩලයේ ගරු භාණ්ඩාගාරික පන්නිපිටිය මාකුඹුරේ සැදැහැවත් පරිත්‍යාගශීලී, ඇම්.ඩී.ඇස්. පෙරේරා මහතාට සහ එම මහත්මියටත්, සංරක්ෂණ මණ්ඩලයේ සභාපති, ගම්පහ මිත්‍රුවන්ගොඩ පාරේ අංක 47 හි නිවැසි සාම විනිසුරු ඩී.පී. සේරසිංහ මහතාට හා එම මහත්මියටත් "මේ පුණ්‍ය කර්මය පරම ශාන්ත නිර්වාණ සම්පත්තිය සාදා ගැනීමට හේතු වාසනා වේවා" යි පතමු.

මෙය ශෝභන ලෙස මුද්‍රණය කර වූ ශ්‍රී දේවි ප්‍රින්ටින් වර්ක්ස් හි අධිපතිතුමා ප්‍රධාන කාර්‍ය මණ්ඩලයටද නිරෝගි සුව දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරමු.

සම්පාදක

2531
1987.12.21
මීතිරිගල නිස්සරණ වනය
මීතිරිගල.

# "ආදර්ශ සම්පන්න යෝගාවචර ජීවිතයෙක අවසානය"

කෝවිද භික්ෂු නම පරිණත පුණ්‍ය සම්පත්තියක් හා එහි තරව පිහිටා ගත්තකු බවත්, අපට මුල පටන්ම ප්‍රකට වී තිබුණා. මේ ශ්‍රේෂ්ඨ යෝගාවචරයා බලවත් අරමුණකින් ඈත රටක සිට පැමිණ ඉතා කෙටි කාලයක් තුළ දී විශාල ශාසනාර්ථයක යෙදී නොනැසෙන සැනසුමක් සලසා ගත් බව පෙනේ. සැනසුම කැමති සැමදෙනාටම, විශේෂයෙන් සැනසුම කැමැති අපේ යෝගාවචර පිරිසට "මේ චරිතාදර්ශය තම තමන්ගෙත් සදර්ථයන් මුදුන් පත් කර ගැනීමට උපකාර වේවා" යි මම ප්‍රාර්ථනා කරමි.

මෙයට
සසුන් දියුණුව කැමැති.
මාතර ඤාණාරාම ස්ථවිර

2531
1987.12.23 දින
මීතිරිගල නිස්සරණ වනය
මීතිරිගල.

# "අධ්‍යාත්ම සෘද්ධිය"

මම මගේ ගෝලයා වෙමි. මගේ ගුරුවරයාත් මම වෙමි. මෙය විහිළු කියමනක් නොවේ. අර්ථ පූර්ණ චින්තක ප්‍රවාදයෙකි. "අත්තාහි අත්තනො නාථො - අත්තදීපා විහරථ - තුම්හෙහි කිච්චං ආතප්පං" - යනාදි සර්වඥ ප්‍රවචනයන්ට අනුරූප සදුක්තියෙකි.

අප හැම දෙනම අපගේ සැනසිලි පෙරහැර පැවැත්විය යුත්තේ තමන් තමන්ගේ ගෝලයාත් ගුරුවරයාත් වන නියාවෙනි. බුදුසසුනෙන් අපට ලැබෙන පහන් බව තමන් දැක ගැනීමේ - තමන් හැඳින ගැනීමේ එළියෙකි. එනම් අපේ අධ්‍යාත්මය - ජීවිතයේ ඇතුල් තතු දැක ගැන්මේ ආලෝකයයි. එය සාමාන්‍ය එළියෙන් කළ නොහැකිය. හැමදෙයකම අධ්‍යාත්මයක් තිබේ. ඒ අද්ධ්‍යාත්ම සෘද්ධියේ ප්‍රාතිහාර්යය අචින්ත්‍යරූපීය.

හොඳට පල දරණ කොස් ගසක් ගැන සිතන්න. භාව චින්තන වශයෙන් එහි අධ්‍යාත්මය විසඳන්න. මෙතරම් ලොකු ගසක් හැදී වැඩී නියම කාලයට සිය ගණන් ගෙඩි වලින් සැරසීගන්නා මේ ගසේ ප්‍රාතිහාර්යය ඔබට දැකගත හැකිය. මෙය මේ ගසේ අධ්‍යාත්ම මහිමයයි. එනම් පුංචි කොස් ඇටයක් තුළ ඇති පැලවෙන - පල දෙන ශක්තියයි. මෙයට අපි අධ්‍යාත්මය යයි කියමු. ගසේ අධ්‍යාත්මය මෙන්ම අප හැමදෙනා පානා ජීවිත සපත් කම් ආධ්‍යාත්ම සෘද්ධියේ ප්‍රාතිහාර්ය බව පිළිගත යුතුය.

"පින් රුකෙක මහිම" යන විශිෂ්ට උපන්‍යාසයකින් කෘතහස්ත ලේඛකයකුගේ හුරු අතින් ලියැවී ඇති, නොබෝදා අපවත්වූ යෝගාශ්‍රමීය විදේශික දරු රත්නයක් වන කෝවිද භික්ෂු නමගේ විසිතුරු චරිතාදර්ශයෙන් ජීවිතයක අධ්‍යාත්ම සෘද්ධියේ ප්‍රාතිහාර්යය අපි දැක ගතිමු. දැක සැනසුනෙමු. සැනසිලි ගමනේ ඇණ නොසිට පැරැණි උතුමන් ඉදිරි බලා වැඩිය ධර්ම ගමනට කෝවිද නමත් පෙල ගැසුනේ, "ආරද්ධවිරියො පහිතත්තො - නිච්චං දළ්හ පරක්කමො" යන යෝධ ශක්තීන් පණගන්වාගෙනය. කෝවිද නම ජීවත්වූයේ ධර්මය වෙනුවෙනි. කෝවිද නම අපවත් වූයේ ධර්මය වෙනුවෙනි. අපි දුක් නොවෙමු. කෝවිද ජීවිතයේ භාවිත වාසනාව යාව නිබ්බාණ වේවා"

සැනසිලි ගමනට එක්වූ අපේ සසුන් දරු පිරිසට මේ කෝවිද වත ප්‍රාණජීව වේවා"

"සංඛාරා සස්සතා නත්ථි"

මෙයට,
ධර්මයෙන් සැනසෙන
ක. ජිනවංශ ස්ථවිර

2531
1987.12.11 දින
ගල්දූව ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානය

# පින් රැකෙක මහිම - තෙවන මුද්‍රණය

කෝවිද හිමිපාණන්ගේ චරිත කථාව පදනම් කරගත් "පින් රැකෙක මහිම" කියවීමෙන් අප තුළ ඇතිවූ ශ්‍රද්ධාව මෙම කුඩා පොත නැවත මුද්‍රණය කරවීමට හේතුවිණි.

මෙම කෘතිය නැවත මුද්‍රණය කිරීම, ත්‍රිවිධ රත්නය විෂයයෙහි කෙරෙන ධර්ම දානයක්ම වේවායි ප්‍රාර්ථනය කරමු.

මෙයට

ප්‍රකාශක

පද්මලතා පෙරේරා
රංජිත් පෙරේරා

207/6 ඒ, ධර්මපාල මාවත
කොළඹ 07

# පින් රුකෙක මහිම

## යෝගාවචර ඇමෙරිකන් කෝවිද හිමි චරිතය

"සාරඤච සාරතො ඤතවා
අසාරඤච අසාරතො
තෙ සාරං අධිගචඡනති
සමමා සඞකපපගොචරා."
යමක වගග, ධ.ප. 12

"හරය හරසේ දත්
නොහරය නොහරසේ දත්
හරි සිතුම් මඟ ගත්
දනෝ නිති හරයටමැ පැමිණෙත්"

## පින්-පැලය

මීතිරිගල නිස්සරණ වනයේ ප්‍රධාන කර්මස්ථානාචාර්‍ය්‍ය අතිපූජ්‍ය, මාතර ශ්‍රී ඤාණාරාම මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේගේ හා ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සමුත්පාදක අතිපූජ්‍ය රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශ මාහිමිපාණන් වහන්සේගේ ද ප්‍රථම විදේශික ශිෂ්‍ය රත්නය වූ ගරු ඇමෙරිකන් කෝවිද ස්වාමීන් වහන්සේ 1987 ඔක්තෝබර් මස 21 වෙනිදා උදෑසන, ලග්ගල හෙට්ටිපොල රජයේ රෝහලේදී සිහිනුවණින් යුතුවැ අවසන් හුස්ම හෙලූහ. අපවත්වන විට වයස 29 ක් වූ උන්වහන්සේ

ගේ පැවිදි ජීවිතය අට වසරක් පමණ වූ සුළු කාලයකට සීමා විය. එහෙත් "හරය හරසේ දත්" මේ පින් පැලය ඒ සුළු කාලය තුළ සම්බුදු සසුනෙහි මැනවින් මුල් බැස ගෙන හරවත්වැ, ඔදවත්වැ, තෙදවත්වැ, වැඩී, අතු පතර විහිදුවා, මල් පල දරා, සසුන් කෙත දස'තැ සුවඳවත් කළේය.

## "හැදෙන-ගස"

සසර භාවිත සන්තානවත් මේ බුද්ධ පුත්‍රයාණන් වහන්සේ මෙලොව එළිය දුටුවේ 1958 මැයි මස 11 වන දින ඇමෙරිකාවේ ලුසියානා ජනපදයේ පිලිප් ෆැන්ට් දම්පතීන්ගේ එකම පුත්‍රයා - එකම දරුවා හැටියටය. ක්‍රේග් ෆැන්ට් නම් වූ මේ පින්වත් දරුවාගේ ළමා කාලයේදීම යම් යම් අසාමාන්‍ය දක්ෂතා, කුශලතා, ප්‍රවණතා මතුවන්ට විය. පාසැලේදී තමා සමඟ එකට සිප් සතර හදාරණ කුඩාවුන් අතර නායකත්වය ඔහුට හිමි විය. වයස 18-19 පමණ වන විට ඔහු ටෙක්සාස් ජනපදයේ විශාල වැටුපක් ලබන වගකිවයුතු තනතුරක් (ප්‍රධාන අරක්කැමි) දරන්නට සමත්විය. සාමාන්‍යයෙන් එබඳු ලාබාල තරුණවියේදී නොපැවරෙන අන්දමේ භාරදූර වගකීමක් දරමින් තමා යටතෙහි සිටින සේවක පිරිස දැඩි ශික්ෂණයකින් පාලනය කිරීමට තරුණ ක්‍රේග් පසුබට නොවීය. එහි ප්‍රතික්‍රියාවක් වශයෙන් පැනනැඟුණු විරෝධිතා- එල්ල වූ තර්ජන නිසා පොලීසිය ඔහුට ආරක්ෂක භටයෙකු පවා ලබා දුන්නේය.

එහෙත් මේ වන විට ක්‍රේග් ගේ සිතුම්-පැතුම් බුදුදහම දෙසට යොමු වී අවසානය. පාසැලේ සිට ගෙදර ආ පසු පොත් ටික පසෙක දමා වනරොදකට ගොස් කාලය ගත කිරීමත්, සමාධියකට හුරු යම් යම් අත්දැකීම් ළමාවියේදීම ලැබගැන්මත් ඔහුගේ "හැදෙන-ගසෙහි" "දෙපෙත්ත" මෙන් විය. වියට්නාම් යුද්ධය පවතින සමයේදී රූපවාහිණියෙන් දුටු භික්ෂු රූප ඔහුගේ සිතුම්-පැතුම් පිළිබඳව විශාල පරිවර්තනයක් ඇති කළේය. එතෙක් බුදු දහම පිළිබඳව කිසිත් නොදත් ක්‍රේග් තම අනාගත දිවිපෙවෙතෙහි පැහැදිලි ඡායාවක් ද ඒ තුළින් දුටුවේ ය. වයස 15 වන විට ඔහු බුදු දහම වැළඳගෙන හමාරය. අවිහිංසාවට තම සිත නැඹුරු කරනු පිණිස නිර්මාංශ ප්‍රතිපත්තිය පිළිගත් ඔහු තමා රැකියාව කරන හෝටලයෙන් දිරිගැන්වෙන රස තෘෂ්ණාව ද එමගින් පාලනය කර ගත්තේය. පොතක් කියවන විට, රූපවාහිණියට නෙත් යොමු කරන විට, ශූන්‍යත්වය, නිස්සාරත්වය පිළිබඳ හැඟීම් ඔහු තුළ පහළ වන්නට විය. මේ දුක්බර සසර නිසරු රැහුම් කෙරෙහි කළකිරුණු ක්‍රේග් ජීවිතයක නියම හරය වන නිවන් අමාරසයම සොයා පෙරදිගට පානැඟීමට අදිටන් කරගත්තේය.

## ලක් පොළොවට

මේ අනුව 1978 වසරේ දී එවකට 20 හැවිරිදි ක්‍රේග් ලක් බිමෙහි පා තැබීය. මීගමු පෙදෙසේ නිවෙසක නතර වී, දවසෙහි වැඩිකාලයක් භාවනාවෙන් ගත කරන අල්පේච්ඡ ගුණයෙන් යුතු මේ විදේශික තරුණයා ගැන පැහැදුණු නිස්සරණ වනයේ දායක මහතුන් කිහිපදෙනෙක් මොහු නිස්සරණ වන සෙනසුනෙහි අතිපූජ්‍ය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ හමුවට කැඳවාගෙන ආහ. තම අනාගත සසුන් ගමනෙහි මාර්ගෝපදේශකයාණන් වහන්සේ මෙසේ හැඳින ගත් ක්‍රේග් නොබෝ දිනකින් ම උන්වහන්සේ වෙතින් උපාසක දශ ශීලය සමාදන් ව නිස්සරණ වනයේ ගිරි මුදුනෙක පිහිටි විවේකී කුටියක භාවනානුයෝගීව වෙසෙන්නට විය. එහෙත් සසුන්ගත වී මහණ දම් පිරීමට ඔහු තුළ ඇති දැඩි අභිලාෂය ඉටු කරගැනීම පහසු කාර්‍යයක් නොවීය. ඒ, දෙමාපියන් වෙතින් පැනනැඟුණු දැඩි විරෝධය නිසාය. තම එකම පුත්‍රයා, එකම දරුවා, දුරු රටෙක අන්‍ය ආගමක පැවිදිව දුෂ්කර යෝගී ජීවිතයක් ගෙවනු දැකීම ඔවුනට කිසිසේත් අභිමත නොවීය. මේ අතර, නුපුරුදු රටෙක, නුපුරුදු ආහාරපාන ගැනීමෙන් ක්‍රේග් ගේ සෞඛ්‍ය තත්ත්වයද පිරිහෙන්නට විය. ඒ මේ හේතුන් නිසා ආපසු සිය රට යාමට ඔහු තීරණය කරගත්තේ කෙසේ හෝ යළිත් මෙහි අවුත් මහණ දම් පිරීමේ අධිෂ්ඨානය හද පත්ලේ සඟවාගෙනය.

## පැවිදි-පිදීම

සියරට ගොස් නැවත මාපියන් හමුවූ නමුත් මෙහිදී තමා තුළ දල්වා ගත් ධර්මප්‍රදීපය අන්‍යාගමික වාතාවරණයෙන් නොනිවා රැකගැනීමට ක්‍රේග් සිය නිවසේ බුදු මැදුරක්ද සකස් කර ගත්තේ ය. තම සෞඛ්‍ය තත්ත්වයද මඳක් යහපත් අතට හැරුණු පසු නොපමාව පැවිද්ද ලැබීමේ ස්ථිර අධිෂ්ඨානයෙන් හෙතෙම යළිත් ලක්දිවට සැපත් විය. ඒ වනවිට අතිපූජ්‍ය මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ වැලිවේරියේ දනවුකන්දේ සිරිමංගල යෝගාශ්‍රමයෙහි වැඩවිසූ බැවින් පැවිදි පින්කම එහිදී පැවැත්වීමට කටයුතු පිළියෙල කැරුණි. ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ පැවිද්ද ලබන ප්‍රථම විදේශිකයා වූ මේ ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයාට සුදුසු නමක් තැබීම අතිපූජ්‍ය පණ්ඩිත ජිනවංශ මාහිමිපාණන් වහන්සේටම පැවරුණි. තම සිසු දරුවන්ට චරිතානුකූලව අර්ථවත් නම් තැබීමෙහි විශේෂ හැකියාවක් ඇති උන්වහන්සේ තරුණ ක්‍රේග් සඳහා තෝරා ගත් නම "කෝවිද" විය.

කෝවිද යනු දක්ෂතාවක්, හසළබවක් ඇත්තකු හඟවන පදයකි. තමා උපතින් ගෙන ආ දක්‍ෂතාවන් මෙන්ම පුණ්‍ය ශක්තිය ද සසුන් උරගලෙහි උරගා බැලීමට කරන අභියෝගයක් බඳු මේ "කෝවිද" නාමය ඇතිව මෙම පින්වත් විදේශික තරුණයා 1979 අගෝස්තු මස 25 වෙනිදා දුර්ලභ වූ ප්‍රව්‍රජ්‍යා ලාභය ලැබීය.

පැවිදිවී ටික කලකට පසුව නිස්සරණ වනයට වැඩම කළ කෝවිද හිමියෝ ධර්ම-විනය හදාරමින් භාවනානුයෝගීව කල්ගෙවූහ. ධර්මකාමීත්වයක් මෙන්ම ශික්ෂාකාමීත්වයක්ද ක්‍රමයෙන් උන් වහන්සේ තුළ වැඩෙන්නට විය. පැවිද්දෙන් පසුව ලබන උපසම්පදාව මෙකල බොහෝවිට සිදුකැරෙන්නේ විසිවයස් සම්පූර්ණ වීමේදී අවශ්‍යයෙන්ම කළ යුතු ශාසනික චාරිත්‍ර ධර්මයක් ඉටු කිරීමක් වශයෙන් හෝ ගුරු අණට කීකරු වීමක් වශයෙනි. එහෙත් කෝවිද හිමියන්ගේ උපසම්පදාව එවැනි ආකස්මික හේතුවකින් සැළසුණු සිද්ධියක් නොවීය. "මම විනය පිටකය කියෙව්වා, මට ඒ ශික්ෂාව පිළිපැදීමට ආශාවක් ඇතිවුනා", යනුවෙන් උන් වහන්සේ උපසම්පදාව ලැබීමට තමන් තුළ ඇති මූලිකම සුදුසුකම හෙළිකළහ. මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේද සුපුරුදු මුදිතා ගුණයෙන් කෝවිද හිමියන්ට ඊට අවසර දෙමින් උපසම්පදා පින්කම සඳහා නොපමාව කටයුතු සම්පාදනය කළහ. සාමාන්‍යයෙන් ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ උපසම්පදා මහෝත්සවය එකල පැවැත්වුනේ දෙවසරකට වරෙකි. එද, යෝගාශ්‍රම මධ්‍යස්ථානයට අයත් උදකුක්ඛෙප සීමාවෙහිදීය. එසේ ද වුවත් ගරු කෝවිද හිමියන් සඳහා විශේෂ උපසම්පදා උත්සවයක් මීතිරිගල නිස්සරණ වනයේ බද්ධ සීමා මාලකයේ දී සිදු කිරීමට විධිවිධාන යෙදුණි. ඒ අනුව 1980 නොවැම්බර් මස 26 දින එම සීමා මාලකයේදී අතිපූජ්‍ය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් උපාධ්‍යායයන් වහන්සේ කොට අතිපූජ්‍ය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශ මාහිමිපාණන් ආචාර්යයන් වහන්සේ කොට ගරු ඇමරිකන් කෝවිද හිමියෝ උතුම් වූ උපසම්පදාව ලැබූහ. මෙම උපසම්පදා උළෙලෙහි විශේෂත්වය හෙළිකරමින් ඒ අවස්ථාවේදී අතිපූජ්‍ය ජිනවංශ මාහිමිපාණන් ප්‍රකාශ කළේ චිරාගත සම්ප්‍රදායෙන් ඉවත්ව මෙබඳු උපසම්පදාවක් පැවැත්වෙන 'පළමුවන අවස්ථාවත්, අවසාන අවස්ථාවත්,' මෙය බවය.

## සිල්-මල්

උපසම්පදා ශීලය වඩාත් තර කර ගැනුම සඳහාත්, යෝගකර්මයට තම කය සකස් කරගැනුම සඳහාත්, ගරු කෝවිද හිමියන් අනුගමනය

කළ අල්පේච්ඡ ප්‍රතිපත්ති රැසෙකි. තමන් වහන්සේගේ පරිහරණය පිණිස සීමිත පිරිකර සංඛ්‍යාවක් ම කුටියේ තබා ගැනීමට උන්වහන්සේ නිතර ම උත්සාහ කළහ. අත්‍යවශ්‍ය යමක් අමුතුවෙන් කුටියට ගෙන ඊමට සිදුවූ විට, අවශ්‍යසේ සළකා තමන් වෙත තබාගෙන සිටි අන් යමක් අනවශ්‍ය දෙයක් ලෙස කුටියෙන් බැහැර කිරීම උන්වහන්සේගේ සිරිතවිය. වනගතව හුදෙකලාව යෝගී දිවිපෙවෙතක් ගෙවන්නකුහට ගසක් යට, ගලක් මත, පවා සැතපීමට සිදුවේ. එයට හුරුවීම් වශයෙන් හිස තබන කොට්ටය පවා කෝවිද හිමියන්ගේ කුටියෙන් බැහැර කැරුණි. ගෙන් ගෙට පිඩු සිඟීමෙන් ලැබන අහරින් දිවිපැවැත්වීමට, එක ආහාර වේලෙන් යැපීමට, උන්වහන්සේ ක්‍රමයෙන් පුරුදු වූහ. මහාකාශ්‍යප චරිතයද, ආර්‍යවංශ ප්‍රතිපදාවද, මුනි සූත්‍ර, නාළක සූත්‍ර ආදියෙහි එන මොනෙය්‍ය ප්‍රතිපදාවද, විශුද්ධිමාර්ගයෙහි සඳහන් වන පැරණි ලක්දිව යෝගාවචර තෙරුන් වහන්සේලාගේ අල්පේච්ඡ ප්‍රතිපදාවද, කෝවිද හිමියන්ගේ සිත් ගත් පරමාදර්ශ විය.

හුදෙකලා යෝගී දිවිපෙවෙතකට අර අඳින කෝවිද හිමියෝ ස්වකීය උපාධ්‍යායයන්වහන්සේට හා ඇසුරු කරන සබ්‍රම්සරුන්වහන්සේලාට තමන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් ද අමතක නොකළහ.මහෝපාධ්‍යායන් වහන්සේ කොළඹ මහාරෝග්‍යශාලාවෙහි නැවතී ප්‍රතිකාර ලැබූ එක් අවස්ථාවෙක, ඒ වෙනුවෙන් ඇපකැප වී උපස්ථානය කළ ආකාරය වෛද්‍යවරුන්ගේද ප්‍රසාදයට ලක්විය. එමෙන්ම, මාහිමිපාණන් වහන්සේට නිතිපතා පා මිරිකීම් (සම්බාහනය) ආදියෙන් හා අවශ්‍ය දුර්ලභ බෙහෙත් සිය මව්රටින් ගෙන්වා දීමෙන්ද තමනට කළ හැකි සෑම උපකාරයක්ම කළහ. ශාසනාභිවෘද්ධිය සඳහා අතිපූජ්‍ය මාහිමිපාණන් වහන්සේගේ චිරජීවනය සැළසීම මෙන්ම උන්වහන්සේගෙන් සිසු පිරිසට ලැබෙන ධර්ම දායාදය අනාගත පරම්පරාව උදෙසා ආරක්ෂා කොට තැබීමත් කෝවිද හිමියන්ගෙන් ඉටුවුනු අනුස්මරණීය සේවාවකි. මාහිමිපාණන් වහන්සේ විසින් පවත්වන ලද දේශනා 50 ක් පමණ පටිගත කොට සුරක්ෂිතව තැබීමට උන්වහන්සේ එයට අවශ්‍ය උපකරණ මව්පියන් වෙතින් ලබාගත්හ. එසේම ඒ පිළිබඳ දූරදර්ශී ආරක්ෂා සංවිධානයක්ද යෙදූහ. නිස්සරණ වනයෙහි යෝගාවචර පිරිසට එකතුවන විදේශික සබ්‍රම්සරුන්වහන්සේලාගේ යහපත තකා සෙනසුනෙහි පුස්තකාලය ඉංග්‍රීසි ධර්ම පුස්තකයන්ගෙන් පොහොසත්කිරීමට උන්වහන්සේ විශේෂ උත්සාහයක් දැරූහ. තමන්ගේම ප්‍රයෝජනය සඳහා ගත් ග්‍රන්ථ රාශියක් පුස්තකාලයට පරිත්‍යාග කිරීමෙන් නොනැවතී එවැනි පරිත්‍යාග කිරීමට තම මව්පියාදී ඥාතීන් ද උනන්දු කරවූහ. තම සබ්‍රහ්මචාරීන් වහන්සේලා වෙනුවෙන් ඇතැම් තීරණාත්මක අවස්ථාවන්හිදී ඉදිරිපත්ව යම් යම් ගැටළු නිරාකරණය කිරීමට උන්වහන්සේ

සමත් වූහ. එහිලා උන්වහන්සේට පිහිට වූයේ ගිහිකල දියුණු කරගත් සංවිධානය හා පාලනය පිළිබඳ කුශලතාවත්, හැඟීම්වලට ගැති නොවී සාධාරණ තීරණ ගැනීමේ සහජ ශක්තියත්ය.

සඟපිරිසේ පොදු යහපත උදෙසා උන්වහන්සේ ගත් පියවර අතුරින් විශේෂයෙන් සඳහන් කළ යුත්තේ සෙනසුනෙහි සාංඝික භාණ්ඩාගාරයෙහි ක්‍රමවත් සංවිධානයක් ඇති කිරීමට උන්වහන්සේ ආරම්භ කළ වැඩ පිළිවෙලයි. ව්‍යාකූල තත්ත්වයක් පැනනැගී ඇති අවස්ථාවක එඩිතරව ඉදිරිපත්ව භාණ්ඩාගාරික සම්මුතියද විනයානුකූලව ලබාගෙන කෝවිද හිමියන් නව පාලන ක්‍රමයක් සකස් කළේ හුදෙක් සංඝයාගේ පහසු විහරණය සලකාගෙනමය. එයින් උන්වහන්සේගේ අපිස් ජීවන රටාව මඳකුදු වෙනස් නොවීම උදාර චරිත ශක්තියක් පිළිබිඹු කරන්නකි.

## නැණ-පල

සඟපිරිස වෙනුවෙන් ආමිස වශයෙන් කෙරෙන හැම සංග්‍රහයකටම වඩා නිරාමිස වශයෙන් කෙරෙන ධර්ම සංග්‍රහයම ශ්‍රේෂ්ඨ බව දත් කෝවිද හිමියෝ එයට නිසි අධ්‍යාත්ම ශක්තිය වගාකරගැනීමට උත්සාහවත් වූහ. උන්වහන්සේ පයඹාප්තියෙන් පමණක්ම සෑහීමකට පත්වන්නවුන් ඉවසුයේ ශීඝ්‍රගාමී බස් රථයක්, මහමඟ අවුරාගෙන පැද්දි පැද්දී ඇදෙන බරකරත්තයක් ඉවසන්නාක් මෙනි. "ලෝකයෙන් අඩක් දුර ගෙවා මා මෙහි පැමිණියේ පොත් කියවන්නට නොවේ" යනුවෙන් වරක් උන්වහන්සේ ප්‍රකාශ කළේ එවැන්නවුන්ගේ නුවණැස පාදාලීම සඳහාය. ශාසන චිරස්ථිතිය ගොඩනැගිලි මත රඳා නොපවත්නා බව උන්වහන්සේට මැනවින් එත්තු ගිය කරුණකි. පදකීපයකින් ගැඹුරු අරුතක් උපහාස රසයද මුසු කොට ඉදිරිපත් කිරීමෙහි සමත් කෝවිද හිමියන් ගොඩනැගිලි ගැන සීමාන්තික උනන්දුවක් දක්වන්නවුන් පිළිබඳව ලිපියක සඳහන් කරමින් ජේදයක් නිම කළේ, "වැඩි දෙනෙක් ගොඩනැගිලි ගැනම උනන්දුවෙති. බිඳ දැමිලි ගැන උනන්දුවන්නෝ ඉතා ටික දෙනෙකි", යන පිරුළෙනි. "ගොඩනැගිල්ල" සසර වඩන සංස්කාරයන් හැටියටත්, "බිඳදැමිල්ල" විසංස්කාර වූ නිර්වාණය හැටියටත් ගත්කල මේ පිරුළ අතිශයින්ම අර්ථවත්ය.

සති-සම්පජඤ්ඤයෙන් යුතුව හැම ක්‍රියාවක්ම කිරීමට කෝවිද හිමියෝ නිතරම වෑයම් කළහ. එහි අඩුපාඩුවකින් වරදක් සිදුවූ විට තමන් තවම "අකෝවිද" බව සිනහමුසු මුහුණින් පිළිගත්හ. උන්වහන්සේගේ සරල

දිනචරියාව හා සතිමත් ඉරියවු පැවැත්ම යෝගාවචර පිරිසට ද ආදර්ශයක් විය. "කෝවිද හිමියන්ගේ දර්ශන මාත්‍රයම ධෛර්‍යයකැ"යි කියවෙන තරමට ඒ ආදර්ශය මහඟුවිය.

කෝවිද හිමියන් තුළ වූ නෙක්ඛම්ම සංකල්පයෙහි ශක්තියත් තුණුරුවන් කෙරෙහි තුබුණු අචල ශ්‍රද්ධාවත් හෙළිකැරෙන සිද්ධියක් 1982 දී සිදුවිය. තමන්ගේ එකම පුත්‍රයා තමනට අහිමිවීම තවදුරටත් ඉවසිය නොහැකි වූ තැන පිලිප් ෆැන්ට් යුවළ මීතිරිගල නිස්සරණ වනය වෙත ළඟා වූයේ කෝවිද හිමියන් කෙසේ හෝ කැඳවාගෙන යෑමේ දැඩි අධිෂ්ඨානයෙනි. මහා මංගල සූත්‍රය උන්වහන්සේගේ ප්‍රියතම සූත්‍රයක් වූ බැවින් "මාතාපිතු උපට්ඨානය" ට මේ ලැබුණු අවස්ථාව උන්වහන්සේ පැහැර නොහැරියහ. ඔවුනට ඉතා හොඳින් උපස්ථාන කරමින් දිවයිනෙහි දර්ශනීය ස්ථාන පෙන්වීමට ඔවුන් සමග සංචාරය ද කළහ. එහෙත් ආපසු සියරටට යාමට ඔවුන් කළ ඇවිටිලි වලට අවනතවූයේ උන්වහන්සේ නොවේ. ගරුතර මහෝපාධ්‍යාය මාහිමිපාණන් හමුවෙහි හැඬූ කඳුලෙන් යුතුව කරුණු කියමින් කෝවිද හිමියන්ගේ දැඩි සිත මොළොක් කිරීමට ඔවුන් දැරූ ප්‍රයත්නය මුළුමණින්ම අසාර්ථක වූයේ මහා මංගල සූත්‍රයෙහි එන අටතිස් මඟුල් කරුණු අතරින් තිස් අටවැන්නම කෝවිද හිමියන්ගේ ඉලක්කයවූ බැවිනි.

"ඵුට්ඨස්ස ලොක ධම්මෙහි
චිත්තං යස්ස න කම්පති,
අසොකං විරජං ඛෙමං
එතං මංගල මුත්තමං"

"අටලෝ දහමින් පහස්නා ලද යමෙකුගේ සිත නොසැලේද, ශෝකයෙන් තොර ද, කෙලෙස් රජසින් තොරද, බිය රහිත ද, මෙය උතුම් මඟුලි.

සු.නි.බු.ජ. 82 පිට

## මෝරන හරය

"කුලයා කෙරෙහි ද ගණයා කෙරෙහිද නො ඇලී", සෙනසුනකට හෝ කුටියකට හෝ නොබැඳී, අසඞ්ගචාරීව විසීමට කෝවිද හිමියෝ අදිටන් කරගත්හ. චාරිකාවේ වැඩම කරමින්ද, වඩාත් විවේකී සෙනසුන්වල මඳ

කලක් වැඩ වෙසෙමින්ද, මෙම පිළිවෙත අනුව දිවිගෙවීමට උන්වහන්සේ යොමුවූයේ 1984 දී පමණය. ගාලු දිස්ත්‍රික්කයේ ඕපාත රජවත්ගල වන සෙනසුනෙහි උන් වහන්සේ වැඩ විසුවේද මේ අවදියේදීය. තමන් වහන්සේ ගත් නිවන් පරමාර්ථය මුදුන් පත් කරගැනීම පිණිස වනගතව, ඒකචාරීව, කාය-ජීවිත නිරපේක්ෂකව වීර්‍ය්‍ය වැඩිය යුතු බව ක්‍රමයෙන් උන්වහන්සේට වැටහී ගියේය. සිංහරාජ කැලයට වැඩම කළ උන්වහන්සේ ඒකචාරීව මුනි ප්‍රතිපදාවට නැඹුරුව එහි විවෘත ගල්ලෙනක වැඩ වෙසෙමින් සැතපුම් දෙකක් පමණ ඈත ගොඩුරු ගමට පිඬුසිඟා වඩිමින් විවේක සුඛයෙහි සිත අලවා මාස කිහිපයක් එහි ගත කළහ.

"ඒකං චරන්තං මුනිං අප්පමත්තං
නින්දා පසංසාසු අවෙධමානං
සීහං ව සද්දෙසු අසන්ත සන්තං
වාතංව ජාලම්හි අසජ්ජමානං
පදුමංව තොයෙන අලිම්පමානං
නෙතාරමඤ්ඤෙසමනඤ්ඤනෙය්‍යං
තං වාපි ධීරා මුනිං වෙදයන්ති."

මුනි.සු.සු.නි.ඛු.ජ. 64

"එකලාව හැසිරෙන, මොනෙය්‍ය ධර්මයෙන් යුක්ත වූ, නින්දා ප්‍රශංසායෙහි නොසැලෙන්නාවූ, සිංහයෙකු සෙයින් ශබ්දයන්ගෙන් තැතිනොගන්නාවූ, දැලෙහි සුළං සෙයින් නොබැඳෙන්නා වූ, දියෙන් නොතැවරෙන පියුමක් සෙයින් කාමයන්හි නොතැවරෙන, අනුනට මඟ පෙන්වන, අනුන්ගෙන් මඟ පෙන්වීමක් නොපතන, හෙතෙම, මුනිවරයෙකැයි පණ්ඩිතයෝ දනිත්."

## ගුණ - සුවඳ

සිංහරාජ කැලයෙහි වනසතුන් මැද අභීතව එකලාව විසීමෙන් ලත් අත්දැකීම්වලින් පොහොසත්ව නිස්සරණ වනයට වැඩම කළ කෝවිද හිමියන් එහි කලක් වැඩවිසීමෙන් පසුව ඊළඟ විවේක වාසය සඳහා තෝරාගත්තේ මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල ප්‍රදේශයයි. 1985 නොවැම්බර් මාසයේදී උන්වහන්සේ ඒ ප්‍රදේශයට වැඩම කොට පළමුවෙන්ම හෙට්ටිපොල කිවුලවාඩිය විවේක සෙනසුනෙහි නතර වූහ. ඒ අතර මොරගහඋල්පොත ගම්වාසී සැදැහැවත් දායක පිරිස උන්වහන්සේගේ අපිස් පැවැත්මට සරිලන

පරිදි විවේකී වන පෙදෙසක ඉලුක් සෙවිලි කළ කුඩා මැටි කුටියක් තනා පූජා කළහ. පුවක් පටි ගසා සැදූ ඇඳ මැස්සක් හා එයින්ම සාදන ලද කුඩා මේසයක් පමණක් ඇති හරිහැටි දොරක් පවා නොමැති මේ කුටියෙහි උන්වහන්සේ සතුටින් වැඩවෙසෙන අන්දම ඒ පළාත්වාසීන්ගේ පුදුමයට හේතු විය. නිතර අවට ගැවසෙන අලියාත්, අසළ හොල්මන් කරන වළහාත්, කුටියේ ඇඳෙහි ඇදෙන විසකුරු සර්පයාත්, කෝවිද හිමියන්ගේ නිවන් සිත පුබුදු කරවන මරණසතිය මතුකර දුන්හ. එමෙන්ම, වනසතුන් මැද ගත කෙරෙන යෝගී දිවි පෙවෙතකට මෙත් සිතිවිලි උපකාරවත් වන අයුරුද සහජයෙන්ම දැඩි සිත් ඇති උන්වහන්සේට වඩ වඩා ප්‍රත්‍යක්‍ෂවන්නට විය.

ආර්ථික අංශයෙන් දිළිඳු වූ නමුත් ධාර්මික අංශයෙන් ශ්‍රද්ධා ධනයෙන් පොහොසත්වූ මොරගහඋල්පොත හා ඒ අවට ගම්වල පින්වත්හු මේ ලැබුණු දුර්ලභ පුණ්‍ය ලාභයෙන් නිසි පල නෙලා ගත්හ. සැතපුම් දහයක් දොළහක් පමණ ඈත සිට "සුදු හාමුදුරුවන්ට" පිණ්ඩපාතය පූජා කිරීම සඳහා පා ගමනින් මොරගහඋල්පොතට පැමිණෙන සැදැහැවත්හුද වූහ. නැතිබැරිකම් නිසාම වාම් දිවිපැවැත්මකට යොමුවූ අවු-වැසි, සුළං මැද කටුක දිවි සටනක් ගෙන යන මෙ සැදැහැවතුන් පිළිබඳව කෝවිද හිමියන් තුළ වූයේ ඉමහත් කරුණාවෙකි. තමන්ගේ සිතුම් පැතුම් හඳුනාගෙන තමනට බරක් නොවන පරිදි යථාලාභ සන්තෝෂයෙන් යුතුව වැඩ වෙසෙන 'සුදු හාමුදුරුවන්ගේ' සන්සුන් සතිමත් පිණ්ඩපාත චරියාවම ඔවුන්ගේ හදපත්ලට කිඳා බසින 'නිහඬබණක්' විය.

'යථා පි භමරො පුප්ඵං
වණ්ණ ගන්ධං අහෙඨයං
පලෙති රසමාදාය
එවං ගාමෙ මුනී චරෙ"

පුප්ඵ වග්ග - ධ.ප. 49

"යම්සේ බමරා මල ද පැහැය හා සුවඳ ද නොනසමින් මල්පැණි හැරගෙන යේද, එසේ ම මුනි තෙම කුලයන් නොපෙළා. සැදැහැසිත් හා සුසිරිත් නොනසා පිඬු පිණිස ගමෙහි හැසිරෙන්නේය."

කෝවිද හිමියන්ගේ චරිතාදර්ශය අගය කළ හෙට්ටිපොළ උණගොල්ල සිරි සුමතිපාල භාවනා මධ්‍යස්ථානයේ සහ පිරිස උන්වහන්සේ ගිලන් වූ

අවස්ථාවන්හිදී ඉදිරිපත්ව හැම උපස්ථානයක්ම කළහ. දැඩි අධිෂ්ඨාන ශක්තියත් උග්‍ර වීර්‍යයත් නිසා උන්වහන්සේ බොහෝ විට රෝගතත්ත්වය උත්සන්නවනතෙක්ම ප්‍රතිකාර ගැනීමට උනන්දු නොවූහ. පිණ්ඩපාතයේ වැඩිය නොහැකි තරමට ගිලන්වනතෙක්ම උන්වහන්සේගේ අසනීප තත්ත්වය දායකපින්වතුන්හට දැන ගැනීමට පවා නොහැකිවූ අවස්ථාද විය. පෙණහළු හා සම්බන්ධ ආබාධයක් සහ මැලේරියා උණ උන්වහන්සේට බෙහෙවින් පීඩාකාරී විය.

රෝගපීඩා නිසා ලග්ගල ප්‍රදේශයේ තදවැසි ඇති කාලසීමාව මඟ හැරීමටද කෝවිද හිමියන්හට අවශ්‍ය විය. සෞම්‍ය තත්ත්වය කෙසේ වෙතත් හැකිතාක් දුරට ඒකවිහාරීව වැඩවිසීමට උත්සාහ කළ උන්වහන්සේ ඒ කාලසීමාව ගත කළේ බුලත්සිංහල ප්‍රදේශයේ රබර් වත්තක් මැද කඳු මුදුනක පිහිටි කුටියකය. එම රබර් වත්ත හිමි සැදැහැවත් පරිත්‍යාගශීලී ඩඩ්ලි ප්‍රනාන්දු දායක මහතාට ප්‍රශ්නයක් වූයේ උන්වහන්සේට උපස්ථානය සැළසීම නොවේ. කරන උපස්ථාන පිළිගැනීමට උන්වහන්සේ කැමති කරවා ගැනීමය.

මොරගහඋල්පොතටද වඩා විවේකී පරිසරයක් රිසිව කෝවිද හිමියන් ඊරියගස්උල්පොත පිහිටි කුටියට වැඩම කළේ 1987 වසරේ මුල් භාගයේදීය. ඒ අවට ගම් රැසක පින්වත්හු එයින් පුණ්‍ය ලාභය සළසා ගත්හ. මේ වන විට ලග්ගල ප්‍රදේශය තුළ "යටිසුළඟට මෙන්ම උඩුසුළඟටද හමන" සුවඳක් උන්වහන්සේ කෙරෙන් පැතිරී තිබුණි. චාරිකාවේ වඩින අවස්ථාවන්හිදී විවිධ ප්‍රදේශවල වන සෙනසුන්හි හා විහාරස්ථානයන්හි ලැගුම්ගත් මේ "සුදු හාමුදුරුවන්ගේ" ගති පැවතුම්වලින් පැහැදුණු, උන්වහන්සේගේ උට්ඨාන වීර්‍යයෙන් හා "කල්‍යාණ මිත්‍ර" උපදෙස්වලින් උත්සාහවත්වුණු, ඇතැම් සංඝයා වහන්සේලා පවා දිගුකලක් සිට හුරුපුරුදු දායක පිරිස්, දැරූ තනතුරු ආදිය අතහැරදමා වඩා විවේකී පරිසර කරා ඇදෙන්නට වූහ.

"සීල දස්සන සම්පන්නං
ධම්මට්ඨං සච්චවෙදිනං
අත්තනො කම්මකුබ්බානං
තං ජනො කුරුතෙ පියං"

පියවග්ග ධ.ප. 217

"සපිරුණු සිල් හා නුවණ ඇත්තාවූ. දහම්හි පිහිටියා වූ, සිවු-සස් දන්නාවූ, අධිසීල සික්ඛා, අධිචිත්ත සික්ඛා, අධිපඤ්ඤා සික්ඛා යන තමාගේ වැඩෙහි යෙදුණු ඒ මහණ හට ජනයා ප්‍රිය කරයි."

## කඳෙක තිලකුණු

වීසා කාල සීමාව දිගු කරගැනීම සඳහාත් උපාධ්‍යායයන්වහන්සේ බැහැදැකීම සඳහාත්, වසරකට වරක් කෝවිද හිමියන් නිස්සරණ වනයට පැමිණෙන දිනයක් විය. විශේෂයෙන්ම විදේශික ස්වාමීන්වහන්සේලා ඒ දිනය ගැන උදක් බලාපොරොත්තුවෙන් සිටින්නේ උන්වහන්සේ නැවත හමුවී භාවනාවට අදාළ ධර්ම කරුණු සාකච්ඡා කර ගැනීමට අවස්ථාවක් ලැබෙන බැවිනි. විවේකය ප්‍රිය කළ උන්වහන්සේ අවුරුද්දේ අනෙක් කාලය තුළ තම හිතවත් සංඝයා වහන්සේලාට හෝ නිස්සරණ වනය ඇසුරු කරන දායක මහතුන්ට හෝ තමන් වහන්සේ හමුවීමට අනුබල නුදුන්හ. 1987 දෙසැම්බර් 1 වෙනිදා කෝවිද හිමියන් නිස්සරණ වනයට වැඩම කරනු ඇතැයි දැනගන්නට ලැබුණු මේ දෙපිරිසම ඒ ගැන විශේෂයෙන් බලාපොරොත්තුව සිටියහ. එහෙත් නොසිතුවක්ම සිදුවිය.

වස්කාලය අවසන් කොට චාරිකාවේ වැඩම කිරීමට සූදානම් වෙමින් සිටි කෝවිද හිමියන්ට තදබල උණ රෝගයක් වැළඳුණි. සුළු බෙහෙත්වලින් මර්දනය නොවී උණ අංශක 105 දක්වා වැඩි වූ පසුය, උන් වහන්සේ දායක මහතකු වෙත පැමිණ රෝහලින් බෙහෙත් ගෙන්වා ගැනීමට අදහස් කළේ. කෙසේ වෙතත් රෝග තත්ත්වය වඩාත් උග්‍ර වූයෙන් ඔක්තෝබර් 20 වෙනිදා සවස හෙට්ටිපොල රජයේ රෝහලට ඇතුල් වූහ. ඒ වන විට එම රෝහලෙහිම ප්‍රතිකාර ලබමින් සිටි හෙට්ටිපොල භාවනා මධ්‍යස්ථානයෙහිම වයෝවෘද්ධ ගරු ජිනානන්ද හිමියෝ උපස්ථානයට හුරු පුරුදු දැතත්, කුළුණුබර දෙනෙතත් 'සුදු හාමුදුරුවන්" වෙනුවෙන් කැප කළහ. තෙදිනක් නිරාහාරව බෙහෙවින් ගිලන්ව සිටි කෝවිද හිමියන්ට, 'බඩගින්න තිබේ නම් ආහාර ගන්නැයි" යි එදින සැන්දෑවේ වෛද්‍ය උපදේශයක් ලැබුණු නමුදු උන්වහන්සේ විකල් බොජුන් සිකපදය කැඩීමට නොසිතුහ. රාත්‍රී කාලය ද ඇඳ විට්ටමට හේත්තු වී භාවනානුයෝගීව ගත කළහ. පසු දින අළුයම පහමාරට පමණ ළඟ ඇඳේ සිටි ජිනානන්ද හිමියන්ට කථා කොට 'දානෙ ටිකක් ඇත්නම් හොඳය" යි පැවසූහ. දානය ගෙන ඊම සඳහා වහාම විහාරස්ථානයට කෙනකු යැවූ මුත් එය පමා වන බව සළකා ජිනානන්ද හිමියෝ "සුදු හාමුදුරුවන්ට" තේ කෝප්පයක් පිළිගැන්වීමට තැත් කළහ. එහෙත් එය සංඥාවකින් ප්‍රතික්ෂේප කළ උන්වහන්සේ අවසන් ගමනකට සැරසෙන ලෙසක් දැක්වූහ. ජිනානන්ද හිමියන් අතින් කඩිනමින් පෙවුනු ග්ලූකෝස් දියර හැන්දක් පමණක් වළඳා කෝවිද හිමියෝ හොඳින් දෙ ඇස් ඇර බැලූහ. කය තැන්පත්කොට ගෙන දිගු හුස්මක් ගත්හ. සසුනට පණ පෙවූ ප්‍රාණවායුවක් ඒ හා සමඟම නිරුද්ධ විය.

"............ එවං භාවිතාය බො රාහුල ආනාපානසතියා එවං බහුලීකතාය යෙ පි තෙ චරිමකා අස්සාස-පස්සාසා තෙ පි විදිතාව නිරුජ්ඣන්ති. නො අවිදිතා"

මහාරාහුලොවාද සූ.ම.නි.
බු.ජ. 2.150 පිට

"...........රාහුලයෙනි, ආනාපානසතිය මෙසේ වැඩූ කල්හි, මෙසේ බහුලකළ කල්හි යම් අවසාන ආශ්වාස-ප්‍රශ්වාස කෙනෙක් ඇද්ද, ඔවුහු ද ප්‍රකට වුවාහු මැ නිරුද්ධ වෙති, අප්‍රකට වුවාහු නිරුද්ධ නොවෙත්."

## සිහිවටන

ආතුරවූ කයකින් එහෙත් අනාතුරවූ සිතකින් යුතුව දිවිමගෙහි තෙවැනි දශකය ගෙවාලීමටද පෙර වීරෝදාර කෝවිද හිමියෝ මෙසේ මෙලොව දිවි හළහ. කලක සිට පැවති පෙණහළු ආබාධයම උන්වහන්සේගේ අපවත්වීමට ආසන්න හේතුව වූ බැව් පසුව කරන ලද පරීක්ෂණයේදී හෙළි විය. උන්වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය කිරීමට නීතියෙන් අවසර නොලැබුණෙන්, හෙට්ටිපොල භාවනා මධ්‍යස්ථාන භූමියෙහි තැන්පත් කිරීමට ගරු උපාලි පියනන්ද හිමියන් ප්‍රමුඛ එහි සඟ පිරිස විසින් විධි විධාන යොදන ලදී. නෛර්‍යාණිකවූ සද්ධර්මයෙහි ජීවය තමන්ට හඳුන්වා දුන් 'සුදු හාමුදුරුවන්ට' තම අවසන් බුහුමන් දැක්වීමට ලග්ගල ප්‍රදේශවාසී සැදැහැවත්හු තෙදිනක් තිස්සේ භාවනා මධ්‍යස්ථානය කරා ඇදී ආහ. ඉන්පසුව, ඔක්තෝබර් 25 වෙනි ඉරුදින සවස විදේශික ස්වාමීන් වහන්සේලා දෙනමක් හා ඇමෙරිකන් තානාපති කාර්‍යාලයේ කොන්සල්වරයාද ඇතුළු ගිහි-පැවිදි විශාල පිරිසක් මධ්‍යයේ ගරු කෝවිද හිමියන්ගේ ශ්‍රී දේහය පිළිබඳ අවසාන කටයුතු හෙට්ටිපොළ භාවනා මධ්‍යස්ථාන භූමියෙහි දී ආගමික චාරිත්‍රානුකූලව සිදු කරන ලදී.

පසු දින, කෝවිද හිමියන් අවසන්වරට වැඩවිසූ ඊරියගස්උල්පොත කුටිය බැලීමට එහි වැඩමකළ ස්වාමීන් වහන්සේලා දෙනමකට, නිසල ශාන්ත ආරණ්‍ය පරිසරයක පිහිටි, මැටි බිත්ති තුනකින් හා පැළලි දෙකකින් ආවරණය වූ, තවමත් තපෝ ගුණ උණුසුම නොනිවුනු යෝගී කුටිය දක්නට ලැබුණි. එහි එක් පසෙක සුදු හිමියන්ගේ බඹයකුත් දැඟුලක් දිගු කෙසඟ සිරුර හරහට සැතැප්පවූ කෙටි ඇඳ විය. පසෙක වැඩ දෙකක් තනිව පිරිමැසූ චාම් "මේස - පුටුව" විය. බිත්තියෙහි නිතර දෙනෙත් ගැටෙන තැනෙක එල්වා තිබුණු ආදර්ශ පාඨයක්ද විය.

"බණො වෙ මා උපච්චගා"
"බණාතීතා හි සොචන්ති"

"උතුම් මොහොත ඉක්ම යා නොදෙවු"!
"උතුම් මොහොත ඉක්මවූවාහු ශෝක කෙරෙත් මැයි"

අහස් කුස සිඹින උස් මැදුරුවල වෙසෙන, උඩු ගුවන් තලයට සඳවිමන් විදින, නොහිම් ඉසුරින් පිරි දිවිපෙවෙත් ගෙවන, විදෙස් රටක වැසි දනන් අතර, මාපියන්හට ප්‍රියමනාප එකැමැ පුත්, එකමැ දරු සේ ඉපිද, උපතින්ම හිමි පාරම්පරික ධනය, විදි සැප සම්පත්, ලද තනතුරු, අලුයමැලූ කෙළ පිඬක් සේ හැර දමා, සොඳුරු යොවුන් වියෙහි දී මැ, හඬන වැලපෙන මාපියන්ගේ කඳුළු මුසු මුහුණු නොබලා ගිහිගේ හැරපියා, පරතෙරෙක, දුරුරටෙක, යෝගී සෙනසුනෙක, කෙස් රැවුල් බහා, කසාවත් හැඳ, සම්බුදු සසුනෙහි පැවිදිවැ, තෙරුවන් එකම ධනය කොටගෙනැ, වල් බිහි වූ පිළිවෙත් මග හෙළි කරනු වස් වල් වැදී, රුදුරු වන සතුන් මැද මෙත් ගුණෙන් සිත්සනහා ගෙන, පිඬු සිහාලද කටුක අහර ලොවුතුරු මිහිරකින් හනා වළඳමින්, පවිවේක රස, උපසම රස, දහම් පීති රස-පී- කෙලෙස් ගිම් නිවාගෙනැ, අග්මුල් නොපෙනෙන සසරෙකැ කෙළවරක් දකින රිසින් දිව-රැ නොබලා, දිවි නොතකා, වෙර දරා, මහණ දම් පුරා, සසුන් කෙතැ සිල්-මල් පුබුදුවා, දැහැන් විදසුන් පලින් සරු කොටැ, සිහිසන් ඇතිවැ අවසන් හුස්ම හෙලා, වීරෝදාර යෝගාවචර චරිතාපදානයක් ඉතිරි කළ ඇමරිකන් කෝවිද හිමිපාණන්හට උපහාර ලෙසින් මීතිරිගල නිස්සරණ වනයේ යෝගාවචර පැන් තුඩෙකින් නිමාවන සිහිවටනය මෙතෙකින් නිමියේයි.

# ගුරු - බැති - පුද

භාවනා ගුරුවරයකු හා භාවනා කිරීමට සුදුසු තැනක් ද සොයමින් සිටිද්දී 1978 වසරෙහි අගභාගයේදී අතිගරු මාහිමිපාණන් වහන්සේ මට පළමු වරට මුණගැසුණි. භාග්‍යයකට මෙන් මා සෙවූ කරුණු දෙකම එකම තැනකදී ඉටුවිය.

මාහිමිපාණන් වහන්සේ පිළිබඳව මට මුලින්ම ඇතිවූ හැඟීම් කෙබඳුදැයි කිවහොත් කෙටි කලකට යළිත් අවරදිගට ගොස්, ගිහිගෙයි දොර වසා දමා, ආපසු පැමිණ උන්වහන්සේ යටතෙහි පැවිද්ද ලබාගැනීමට, ඒම ප්‍රමාණවත් විය. උන්වහන්සේගේ දැනුමෙන් හැකි පමණ ලොකු කොටසක් මා සිතින් උරා ගැනීමට තැත්දරමින්, උන්වහන්සේගේ මහපෙන්වීම යටතේ විසීමට ලැබීම එදා සිට මට අයත්වූ ශ්‍රේෂ්ඨ වරප්‍රසාදයකි.

කර්මස්ථානාචාර්යයන් වහන්සේ කෙනකුන් හැටියට කැපීපෙනෙන ගුණය හැරුණු විට, උන්වහන්සේ තුළ ඇති ගුණාංග අතුරෙන් මා වඩාත්ම අගය කොට සළකන ගුණය මෙහිලා වෙන්කැර දක්වතොත්, ඒ උන් වහන්සේගේ සැහැල්ලු සන්සුන් ආකල්පයයි. ඉතාම දුෂ්කර අවස්ථාවක දී පවා සන්සුන්ව, තැන්පත්ව, සිටීමට උන්වහන්සේ පොහොසත් වෙති. එහෙත් එහිදී උන්වහන්සේගෙන් පිටුපෑමක් හෝ ළ-දැඩි නොසැළකිල්ලක් ද කිසි විටෙක සිදුනොවේ. උන්වහන්සේ හමුවට පැමිණීම මෛත්‍රී-කරුණාමය ක්ෂේත්‍රයකට ඇතුළු වීමකි. එහි වන් කෙනෙකුට වඩාත් සරු වූ මානසික තත්ත්වයකින් යුතුව ඉන් පිටවීමට ලැබෙනු නිසැකය.

මනසෙහි දියුණුව පිළිබඳව බෙහෙවින් උදාසීන වූ ආකල්පයක් බලපවත්නා අවධියක, ඈත අතීතයේ පොත පතෙහි ලියැවී ඇති අන්දමේ උත්කෘෂ්ට තත්ත්වවලට ළංවීමේ හැකියාව තවමත් මිනිස් මනස තුළ ඇති බව ඔප්පුකරන ජීවමාන සාධක අතළොස්සෙන් එකක් දැන හඳුනාගන්නට ලැබීම මට විශාල ධෛර්යයක් වී ඇත.

මීතිරිගල
නිස්සරණ වනය

මෙයට
ඇමරිකාවේ කෝවිද භික්ෂු

මෙයට වසර කීපයකට පෙර, අතිපූජ්‍ය මහෝපාධ්‍යාය මාහිම්පාණන් වහන්සේහට අභිනන්දන ග්‍රන්ථයක් වශයෙන් පිරිනැමීම සඳහා එකතු කරන ලද විශේෂ ලිපි සංග්‍රහයකට ගරු කෝවිද හිමියන් විසින් ඉංග්‍රීසි බසින් ලියන ලද ලිපියක මෙම සිංහල අනුවාදයද ඇතුළත් විය. එකී අභිනන්දන ග්‍රන්ථය මෙතෙක් එළි නොදුටු නමුදු මෙම ලිපිය විශේෂ ශීර්ෂ පාඨයක්ද සහිතව, මෙහි ඇතුළත් කැරුණේ "ලේඛකයකු" නොවූ ගරු කෝවිද හිමියන් විසින් මුද්‍රණය සඳහා සැපැයුණු "පළමුවන ලිපියත් අවසාන ලිපියත්" මෙය වන හෙයිනි.